© THE ASSOCIATED NEWSPAPERS

UNIVERSITY HOSPITAL
General Sir John Kotelawala Defence University

# විශ්වවිද්‍යාල රෝහල

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය රෝහල වෙත පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම් ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

# සූතිකා පුහුණු හෙද නිලධාරිණී සහ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී

## (පැයකට ගෙවීමේ පදනම මත)

සුදුසුකම්

<u>සූතිකා පුහුණු හෙද නිලධාරිණී</u>

i. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් හෝ හෙද සභාව පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෙද ඩිප්ලෝමා පාඨමාලාව හෝ හෙද උපාධිය සම්පූර්ණ කර තිබිය යුතුය.

ii. එක් අවුරුදු සූතිකා පුහුණුව (සායනික හා ප්‍රායෝගික) සම්පූර්ණ කර තිබිය යුතුය.

iii. සූතිකා පුහුණු හෙදියක් ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

<u>පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී</u>

i. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණී තනතුරෙහි කාර්යභාරයට අදාලව සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන වසර එකහමාරක (1 1/2) පූර්ණ කාලීන වෘත්තීමය ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව සාර්ථකව හදාරා ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය.

ii. පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියක් ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

<u>පොදු කොන්දේසි :</u>

**1.** එක් පැයක් සඳහා සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ 2017.06.02 දිනැති චක්‍රලේඛ අංක TA/G/PSM/13/2016 අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.

**2.** නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ජායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් 2019.10.07 දිනට පෙර "විධායක අධ්‍යක්ෂක, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර" යන ලිපිනයට යොමු කරන්න. ලියුම්කවරයේ ඉහල වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න.

**3.** අසම්පූර්ණ, ප්‍රමාද වී යොමුකරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**4.** අයදුම්පත්‍ර සහ අදාළ අනෙකුත් විස්තර භාගත කිරීම සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න.

# www.kdu.ac.lk

Source: Sunday Observer, Silumina (2019.09.22)